| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 11 ශ්‍රේණිය | **කතෝලික ධර්මය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 3 යි

## I කොටස

- **1 - 40 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරාන්න.**

1. දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍රයක් වනුයේ,
   i. සොබාදහම
   ii. ශුද්ධ බයිබලය
   iii. ශුද්ධ සභාව
   iv. මිනිසා

2. අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන සභාව වන්නේ,
   i. ශුද්ධ වූ කතෝලික සභාව
   ii. පෙන්තකෝස්ත සභාව
   iii. ගැලවීමේ හමුදාව
   iv. ඇන්ග්ලිකන් සභාව

3. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරුන් සුබ අස්න දේශනා කිරීමට පටන් ගත්තේ,
   i. ගලීලයෙන් හා සමාරියෙන්
   ii. ජුදයෙන් හා ඉදුමියෙන්
   iii. ජෙරුසලමෙන් හා ජුදයෙන්
   iv. රෝමයෙන් හා ග්‍රීසියෙන්

4. අපෝස්තලික යුගයේදී ශුද්ධ සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ඨ පුද්ගලයෙකු වන්නේ,
   i. ශුද්ධ වූ ජුවාම්තුමා
   ii. ශුද්ධ වූ පේදුරුතුමා
   iii. ශුද්ධ වූ ජාකොබ්තුමා
   iv. ශුද්ධ වූ පාවුලුතුමා

5. ඉරුදින දිව්‍ය පූජාවේ දෙවන කියවීම සඳහා බොහෝ විට ගනු ලබන්නේ,
   i. ශුද්ධ වූ පාවුලු තුමාගේ සංදේශ
   ii. මතෙව් ශුභාරංචිය
   iii. පුරාණ ගිවිසුම
   iv. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාපොත

6. දේව ආදරයේ හා ක්‍රිස්තුන්වහන්සේගේ කීකරුකමේ සංකේතය වන්නේ,
   i. කුසලතා
   ii. කුරුසිය
   iii. දිව්‍යසත්ප්‍රසාද වහන්සේ
   iv. ජපමාලය

7. එළිදරව්ව සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ,
   i. සත්‍ය හෙළිවීම
   ii. යහපත ජය ගැනීම
   iii. දේව රැකවරණය
   iv. සැඟව තිබූ යමක් ප්‍රකාශ වීම හෝ අනාවරණය වීම

8. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක් වන්නේ,
   i. තෝබිත්
   ii. බාරුක්
   iii. දානියල්
   iv. ගීතාවලිය

9. ජුදයන් අතට පාවා දීමෙන් පසු ජේසුස් වහන්සේව රැගෙන යන්නේ,
   i. ආණ්ඩුකාර පිලාත් ඉදිරියට
   ii. උත්තම පූජකයාගේ මැදුරට
   iii. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට
   iv. හෙරෝද් ඇන්ටිපස් ඉදිකිරීම

10. අපෝස්තුලුවරුන් දොළොස් දෙනා අතරින් පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා වන්නේ,
   i. ශුද්ධ වූ මහා ජාකොබ් පියතුමා
   ii. ශුද්ධ වූ පේදුරුතුමා
   iii. ශුද්ධ වූ මතියස්තුමා
   iv. ශුද්ධ වූ ස්තේපන්තුමා

11. ''ශ්‍රී ලංකාවේ අපෝස්තුලුවරයා'' යන ගෞරව නාමයෙන් හඳුන්වන්නේ,
   i. ශුද්ධ වූ පේදුරුතුමා
   ii. ශුද්ධ වූ ජුසේවාස්තුමා
   iii. ශුද්ධ වූ පාවුලුතුමා
   iv. ශුද්ධ වූ ජුවාම් මුනිතුමා

12. සමාජ සාධාරණය උදෙසා ඇප කැපවෙමින් සරල හා චාම් ජීවිතයක් ගත කළ ශුද්ධ සභාවේ 266වන ශුදතුම් පියාණන් වූයේ,
   i. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු ශුදතුම් පියා
   ii. අති උතුම් ෆ්‍රැන්සිස් ශුදතුම් පියා
   iii. 16 වන බෙනඩික් ශුදතුම් පියා
   iv. 13 වන ලියෝ ශුදතුම් පියා

13. 'කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටු කර ගත නොහැක' මෙම ප්‍රකාශය කරන ලද්දේ,
   i. පේදුරුතුමන් විසින්
   ii. ශුද්ධ වූ පාවුලුතුමන් විසින්
   iii. ශුද්ධ වූ තෙරේසා මුනිතුමන් විසින්
   iv. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමන් විසින්

14. 'දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම සඳහා ආත්මික හා ශාරීරික සූදානම අත්‍යවශ්‍ය වේ.' ආත්මික සූදානම යනු,
   i. පාපයෙන් තොරවීම
   ii. පාපොච්චාරණය කිරීම
   iii. මනස්ථාපනය වීම
   iv. යහපත් දිවි පැවැත්ම

15. ''මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව'' යන සංවිධානය ආරම්භ කළේ,
   i. ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
   ii. ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා
   iii. ගරු මයිකල් රුද්‍රිගු පියතුමා
   iv. ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

16. ශුද්ධ වූ දේ හා දේව වචනය අගෞරව ලෙස භාවිතා කිරීම මගින් කඩවන දේව පනත වන්නේ,
   i. පළමු පනත
   ii. හතරවන පනත
   iii. දෙවන පනත
   iv. තුන්වන පනත

17. තමාගේ සහෝදරයාට ''මෝඩයා'' කියා ගරහන කවරෙකු වුව ද ඔහු ………….. යටත්වනු ඇත. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
   i. විනිශ්චයට
   ii. ශ්‍රේෂ්ඨාධිකරණයට
   iii. අධිකරණයට
   iv. නිරාගින්නට

18. පිවිතුරු දිවියක් ගතකිරීම සඳහා අපට මඟ පෙන්වන දේව පනත් වන්නේ,
   i. 5 සහ 6 පනත්
   ii. 1 සහ 4 පනත්
   iii. 6 සහ 9 පනත්
   iv. 1 සහ 2 පනත්

19. ''යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතරගුණයක් ආපසු දෙමි'' මෙම ප්‍රකාශය කරන ලද්දේ,
   i. සාකේවුස්
   ii. ලෙවී
   iii. අයකැමියා
   iv. අනනියස්

20. ජනවන්දනාව තුළ සතියේ වැදගත්ම දිනය ඉරුදිනයයි. ඉරුදින දිව්‍ය යාගයේදී අප සමරනු ලබන්නේ,
   i. සබත් දිනයයි
   ii. දිව්‍ය සත්ප්‍රසාදයයි
   iii. මාංශගත වීමයි
   iv. පාස්කු අභිරහසයි

21. ආගමන සමය සහ චතාරික සමය තුළ ජනවන්දනාවේදී භාවිතා කරනු ලබන වර්ණය වන්නේ,
   i. කොළ වර්ණය
   ii. දම් වර්ණය
   iii. රතු වර්ණය
   iv. සුදු වර්ණය

22. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උත්තම පූජක යාච්ඤාව කර දෙවිපියාණන්ට යාච්ඤා කරන ලද්දේ,
   i. මහ බ්‍රහස්පතින්දා දින
   ii. මහ සිකුරාදා දින
   iii. අළු බදාදා දින
   iv. පාස්කු ඉරු දින

23. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාල නීති නියෝග පිළිබඳව සඳහන්ව ඇත්තේ,
   i. නික්මයාම පොතේ
   ii. ගණන් කතාවේ
   iii. ලෙවී ව්‍යවස්ථාවේ
   iv. උත්පත්ති පොතේ

24. යාවේ සම්ප්‍රදායට අයත් කතා පුවතක් වන්නේ,
   i. මෝසෙස්තුමා කැඳවීම
   ii. ආබ්‍රහම්තුමා කැඳවීම
   iii. පළමු මැවීමේ කථාව
   iv. ආදම් සහ ඒව පාපයට වැටීම

25. කතෝලික සභාවට අනුව පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ගණන වන්නේ,
   i. 46යි
   ii. 39යි
   iii. 76යි
   iv. 27යි

26. දිවැසිවරුන් සඳහා භාවිතා කරනු ලබන ග්‍රීක වදන වන්නේ,
   i. නබී
   ii. ප්‍රෝෆෙටේස්
   iii. මෙතෙටේස්
   iv. රබ්බි

27. කිතුනු අප සියලු දෙනා දිවැසිවරුන් බවට පත්වනුයේ,
   i. දසපනත අනුසාරයෙන්
   ii. දේව වචනය කියවීමෙන්
   iii. ප්‍රසාද නිධාන මගින්
   iv. ප්‍රසාද ස්නාපනය මගින්

28. ප්‍රාග් ඉතිහාසය ලෙස ශුද්ධ බයිබලයේ සඳහන් වන පරිච්ඡේද වන්නේ,
   i. උත්පත්ති 1 සිට 14 දක්වා
   ii. උත්පත්ති 1 සිට 24 දක්වා
   iii. උත්පත්ති 1 සිට 11 දක්වා
   iv. උත්පත්ති 1 නික්මයාම 1 දක්වා

29. ස්ත්‍රිය රුචියට වහල්වී වැරදි තීරණ ගැනීමෙන් අපට ලැබෙන පණිවිඩය වන්නේ,
   i. දේව අභිමතයට පූර්ණ නිදහසින් අවනත විය යුතු බවයි.
   ii. දේව ආදරය කිසිවිට සැහැල්ලුවට ලක් නොකළ යුතු බවයි.
   iii. තීරණ ගැනීමේදී තමාගේ අභිමතය අනුව එය කළ යුතු බවයි.
   iv. සැමවිටම අපගේ අවශ්‍යතා ගැන සිතිය යුතු බවයි.

30. අත්තික්කා කොළ අතු ඇඳ සිටි ආදී මව්පියන්ට හම් වස්ත්‍රයක් සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද?
   i. දෙවියන් වහන්සේගේ උදහස
   ii. දෙවියන් වහන්සේගේ කරුණාව
   iii. දෙවියන් වහන්සේගේ අනුකම්පාව
   iv. මිනිසුන් කෙරේ ඇති පැහැදීම

31. සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ ඊශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත් වන්නේ,
   i. ආබ්‍රහම්තුමා සමඟ ගිවිසුමෙනි
   ii. ආදී මව්පියන් සමඟ ගිවිසුමෙනි
   iii. සීනයි ගිවිසුම මගිනි
   iv. පාරාවෝ සමඟ ගිවිසුමෙනි

32. ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබීමෙන් පසු කල පළමු ක්‍රියාව වන්නේ,
   i. ස්නාවක ජුවාම් තුමාට ස්තුති කිරීම
   ii. නාසරත් නුවර ධර්මශාලාවට යාම
   iii. දේශනා කිරීමට පටන්ගැනීම
   iv. පාළුකරයේ දින 40ක් යාච්ඤා කිරීම

33. ශුද්ධ වූ අගුස්තීනු තුමාට අනුව ප්‍රාතිහාර්යයක් යනු,
   i. ස්වභාව ධර්මය තුළ අප දන්නා සත්‍යතාවන්ට පටහැනිව සිදුවන ක්‍රියාවකි
   ii. කිසිවෙකුටත් සිදු කළ නොහැකි බලවත් ක්‍රියාවකි
   iii. සැවොම පුදුමයට පත්වන්නා වූ ක්‍රියාවකි
   iv. දේව ජනතාව අතර පමණක් ඉටුවන පුදුම ක්‍රියාවකි

34. ශ්‍රාවකයන් හැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය පිළිබඳ සඳහන් කරන එකම ශුභාරංචි කතුවරයා වන්නේ,
   i. ශුද්ධ වූ මතෙව් තුමා
   ii. ශුද්ධ වූ ලූක් තුමා
   iii. ශුද්ධ වූ ජොහාන් තුමා
   iv. ශුද්ධ වූ මාක් තුමා

35. දේව රාජ්‍ය යනු,
   i. දෙවියන් වහන්සේ වැඩසිටින රාජ්‍යයයි
   ii. දේව ජනතාව අතර සාමයයි
   iii. දේව කැමැත්තට හා දේව පාලනයට නතු වීමයි
   iv. යහපත් වූ සියලු දෙනා ගමන් කරන ස්ථානයයි

36. යමෙක් …………… ද …………… ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය. ඉහත හිස්තැන් සඳහා අදාල වචන වන්නේ,
   i. ආත්මයාණන් / පුත්‍රයාණන්
   ii. ජලයෙන් / ගින්නෙන්
   iii. ශුද්ධ තෛලයෙන් / ජලයෙන්
   iv. වතුරෙන් / ආත්මයාණන්ගෙන්

37. සැබෑ ලෙස මනස්ථාප වී තම සිත දෙවිඳුන් වෙත හරවා ගැනීම සඳහා සුදුසු පශ්චාත්තාප ක්‍රියාවකි.
   i. දුක් වේදනා හා බලාපොරොත්තු කඩවීම් ඉවසීමෙන් විඳ දරා ගැනීම
   ii. අන් අයගේ දුක් වේදනාවලට පසුතැවිලි වීම
   iii. හැකි සෑමවිටම පාප ක්‍රියාවන්ගෙන් ඈත් වීම
   iv. දෙවිඳුන් ඉදිරියේ තම පව් ප්‍රකාශ කිරීම

38. ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන 2ක වන්නේ,
   i. පූජකවරය / ප්‍රසාද ස්නාපනය
   ii. දිව්‍ය සත්ප්‍රසාදය / අභිවෘද්ධි ආලේපය
   iii. පූජකවරය / ආශිර්වාදකාර බන්ධනය
   iv. පූජකවරය / අභිවෘද්ධි ආලේපය

39. පූජා ප්‍රසාදින් වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකමක් වන්නේ,
   i. සැමවිටම ඔවුන් පිළිබඳ විමසිලිමත් වීම
   ii. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා ගෞරව කිරීම
   iii. පියතුමන්ලා පිළිබඳව තොරතුරු අසා දැනගැනීම
   iv. දේව සේවය නිසි ලෙස ඉටු කරන්නේ දැයි සොයා බැලීම

40. කිතුනු විවාහයේ ප්‍රධාන පරමාර්ථයක් වන්නේ,
   i. දෙදෙනාට විශ්වාසවන්ත වීම
   ii. සතුටින් සහ සාමයෙන් දිවි ගෙවීම
   iii. දෙදෙනා අතර සහයෝගය පවත්වා ගැනීම
   iv. දරුවන් ජනනය හා ඇතිදැඩි කිරීම

(ල. 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

1.

i. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කතෘ හා උපකාරක කතෘ නම් කරන්න.

ii. හේබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද 2ක් ලියන්න.

iii. මුල් කිතුනු සභාවේ ලක්ෂණ 2ක් ලියන්න.

iv. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථ 2ක ලියන්න.

v. පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ සිරිලකට පැමිණි ධර්මදූත නිකායන් 2ක් ලියන්න.

vi. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 2ක ලියන්න.

vii. ශුද්ධ වූ මතෙව්තුමාගේ ශුභාරංචිය සඳහා භාවිතා වන වෙනත් නම් 2ක් ලියන්න.

viii. දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ 2ක් ලියන්න.

ix. පූජක සම්ප්‍රදායට අයත් කතා 2ක් ලියන්න.

x. ආරම්භක දේව ප්‍රසාද නිධාන 2ක් ලියන්න.

(ලකුණු 2x10=20)

2.

i. ශුද්ධ බයිබලයේ ඇති එළිදරව්වාදී ග්‍රන්ථ 2 ලියන්න.

ii. එළිදරව් සාහිත්‍යයේ ලක්‍ෂණ 3ක් ලියා එමගින් ඉදිරිපත් වන ප්‍රධාන අදහස බැගින් ලියන්න.

iii. "ආගමික සංකේත දේව පණිවිඩය අපට ලබා දෙන්නා වූ උතුම් සලකුණුය." එම සලකුණු වත්මන් සමාජය තුළ නවීන විලාසිතා හා මෝස්තර යොදාගැනීමෙන් සිදුවන අයහපත පිළිබඳව කරුණු ඇතුළත් කරමින් ආගමික පුවත්පතකට ලිපියක් ලියන්න.

(ලකුණු 2+3+5=10)

3.

i. දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව මිනිසා මවා උන්වහන්සේ මිනිසාට ආසිරි පතමින් කුමක් කී සේක්ද?

ii. පස්වන දේව පනතට විරුද්ධ පාපයන් 3ක් ලියන්න.

iii. "ජීවිතය දෙවියන් වහන්සේගෙන් මිනිසා ලද තිළිණයකි. එහි පූර්ණ අයිතිය දෙවියන් වහන්සේ සතුය." කිතුනු සිසුවෙකු ලෙස වර්තමාන සමාජයේ සීඝ්‍ර ලෙස ඉහළ යන සියදිවි හානි කර ගැනීම නැවැත්වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 5ක් ලියා විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

4.

i. මල් උයනේ යාච්ඤාව මඟින් පෙන්නුම් කරන ප්‍රධාන කරුණු 02ක් ලියන්න.

ii. ජේසුස් වහන්සේව අත්අඩංගුවට ගැනීමට පැමිණි අවස්ථාවේදී අපෝස්තුළුවරුන් ක්‍රියා කළ ආකාර 3ක් ලියන්න.

iii. ඔබගේ ජීවිතයේදී ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග 5ක් ලියා එම අභියෝග වලට සාර්ථකව මුහුණ දීමට මල් උයනේ යාච්ඤාව මඟින් ඔබට ලැබෙන මගපෙන්වීම විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

5.

i. ඊශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීම සඳහා මිසරයේ රජතුමා ගත් පියවර 02ක් ලියන්න.

ii. මිසර වැසියන්ට මුහුණ දීමට සිදු වූ පළමුවන, සයවන සහ දසවන වසංගත තුන ලියන්න.

iii. මිසරයේ වහල් බවින් මිදී විමුක්තිය කරා යන ගමනේදී වසර 40ක කාලයක් කාන්තාරය තුළ දෙවි සමිඳුන්ගේ රැකවරණය ඊශ්‍රායෙල් ජනතාව අත්දකින ලද අවස්ථා 5ක් ලියා ඔබගේ ජීවිතයට එයින් ලැබෙන පණිවිඩය විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

6.

i. ජේසුස් වහන්සේ දේවරාජ්‍යයේ වටිනාකම් ගැන ඉගැන්වූ උපමා 02ක් ලියන්න.

ii. කන්ද උඩ දේශනයේ භාග්‍ය අට අතරින් භාග්‍ය 3ක් ලියන්න.

iii. දේව රාජ්‍යයේ වටිනාකම් වැඩිදියුණු කිරීමට කිතුනුවකු ලෙස මා හටද වගකීමක් ඇත. ඒ සඳහා ශ්‍රී ලංකාවේ පවතින සාරධර්ම 5ක් ලියා ඒවා ක්‍රියාත්මක කිරීමට ඔබ ක්‍රියා කරන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

7. පහත සඳහන් මාතෘකා අතරින් 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

ii. ස්නාවක ජුවාම්තුමා

iii. ආශිර්වාදකාර බන්ධනයේ ප්‍රසාද නිධානය

iv. දස පනත

(ලකුණු 5+5=10)